RARE

# බෞද්ධ ස්ථාන කේන්ද්‍ර කළහැකි සංචාරක කර්මාන්තය

**(ගාල්ල දිස්ත්‍රික්කයේ කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තෝරාගත් විහාරස්ථාන 5ක් ඇසුරිනි)**

පී.ජී.එන්. චන්දිමාලි
FGS/ARCH/MC/09/003

ප්‍රවේශ අංකය: 1305
වර්ග අංකය:

සමාජීය විද්‍යාපති පුරාවිද්‍යා උපාධියෙහි අවශ්‍යතාවක් පූරණය කරනු පිණිස, කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි.

ජූනි 2015

## Abstract Summery (Summery of the Thesis)

In an era where Sri Lanka is famous as a good tourist destination, in order to increase the Cultural Tourism which is popular among the tourists, this study is carried out among the 56 Temples located in Kadawathsathara Divisional Secretariat of Galle District ,on selected Five (05) centrally focused temples bordering the coastal area; such as Maagalle Gangarama Maha Viharaya, Kaluwella Sri Wardhanarama Purana Viharaya, Minuwangoda Sri Paramananda Raja maha Viharaya, Bogahagodalla Sri Sudarshana Paramananda Purana Maha Viharaya, and Thuwakkugala Watta Purana Viharaya. In the light of developing the tourism industry as a subject, up to now, there have not been any studies carried out in these locations. This is an effort to secure these sacred places, with the Historical background, as well as the sites that have created objects and environmental values, also with an effort to lead further development in to these locations, foreign exchange earnings, securing sacred places and to develop the areas where the temples are located in taking the Tourism Industry beyond the borders of coastal area.

For this study, I have accessed (Used) the Primary and Secondary Sources, and have also used a method in gathering Field study and survey data using questions.

Here, in the first chapter, I have mentioned, Introduction, Study Background, research objectives, area of study, research method, and pre and present research. The Second Chapter is an interpretation on History of Tourism and in the Third Chapter it is the introduction of the studied religious places separately. In the Fourth Chapter, the position of historical significance and factors (reasons) for tourist attractions for each and every place is explained. In the Fifth Chapter, problems arising in developing the Tourist marketing places (areas) and the solutions for same are presented.

In the Final Chapter, keeping aside all the challenges, centered around these places, the presented conclusion (opinion) in developing the Tourist Industry truthfully; and gathering different organizations which were apart till now, gathering suggestions, in order to open the new avenues in Galle Tourism industry , the tourist facilities available are sufficient and further facilities can be arranged, and it was possible to identify the Temple that has more facilities among the other temples which were used in the study.



**tourist**

**develop**

**temple**

**attraction**

**guide**

# නිබන්ධ සාරාංශය


ශ්‍රී ලංකාව හොඳ සංචාරක ගමනාන්තයක් ඇති රටක් ලෙස ප්‍රසිද්ධියට පත්ව ඇති වකවානුවක සංචාරකයන් අතර ප්‍රචලිතව ඇති සංස්කෘතික සංචරනය වර්ධනය කිරීම උදෙසා මෙම අධ්‍යනය ගාල්ල දිස්ත්‍රික්කයේ කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි විහාරස්ථාන පනස්හය අතරින් වෙරළ තීරය මායිම්ව පිහිටි මාගාල්ල ගංගාරාම මහා විහාරය, කලුවැල්ල ශ්‍රී වර්ධනාරාම පුරාණ විහාරය, මිනුවන්ගොඩ ශ්‍රී පරමානන්ද රාජ මහා විහාරය, බෝගහගොඩැල්ල ශ්‍රී සුදර්ශන පරමානන්ද පුරාණ මහා විහාරය සහ තුවක්කුගල වත්ත පුරාණ විහාරය යන විහාරස්ථාන පහ කේන්ද්‍රීයව සිදු කරන ලදී. මෙම ස්ථානයන්හි සංචාරක කර්මාන්තය දියුණු කිරීම විෂයෙහි ලා කිසිඳු අධ්‍යනයක් මෙතෙක් සිදු කර නොමැත. ඓතිහාසික පසුබිම මෙන්ම ස්ථාන සතුව තිබෙන නිර්මිත වස්තූන්වල හා පාරිසරික වටිනාකමත්, ඇතිව මේ ස්ථාන තව දුරටත් සංවර්ධනය කරා ගෙන යාමට මෙන්ම, විදේශ විනිමය ඉපැයීම් කරමින් පුදබිම් සංරක්ෂණයට හා විහාරස්ථාන පිහිටි ප්‍රදේශයන් ද සංවර්ධනය කරමින් සංචාරක ව්‍යාපාරය තවදුරටත් මුහුදු තීරයෙන් ඔබ්බට යොමු කිරිමට දරණ ප්‍රයත්නයකි.

මෙම අධ්‍යනය සඳහා මා විසින් ප්‍රාථමික හා ද්විතීය මූලාශ්‍ර පරිශීලනය කිරීමත් ක්ෂේත්‍ර අධ්‍යනය හා ප්‍රශ්න භාවිත සමීක්ෂණ දත්ත ඒකරාශී කිරීමේ ක්‍රමවේදයත් භාවිතා කරන ලදී.

මෙහි දී මා පළමු පරිච්ඡේදයේ දී හැඳින්වීම, අධ්‍යන පසුබිම, පර්යේෂණ අරමුණු, අධ්‍යන ප්‍රදේශය, පර්යේෂණ ක්‍රමවේදය සහ පූර්ව හා වර්ථමාන පර්යේෂණ පිළිබඳව සඳහන් කෙරේ. දෙවන පරිච්ඡේදයේ දී සංචාරක කර්මාන්තයේ ඉතිහාසය පිළිබඳ විවරණයක් කරන අතර තෙවන පරිච්ඡේදයේ දී අධ්‍යනය කරන ලද ආගමික  ස්ථාන වෙන වෙනම හඳුන්වා දීම සිදු කෙරේ. සිව්වන පරිච්ඡේදයේ දී ඒ ඒ ස්ථානයන් හි ඓතිහාසික වැදගත්කම මෙන්ම සංචාරක ආකර්ශනයට හේතු සාධක පහදා දීම සිදු කෙරේ.  පස්වන පරිච්ඡේදයේ දී සංචාරක අලෙවිකරණ ප්‍රදේශ ලෙස සංවර්ධනයේ දී ඇතිවන ගැටළු හා ඒවාට විසඳුම් ඉදිරිපත් කෙරේ.

අවසාන පරිච්ඡේදයේ දී සියලු අභියෝග පසෙක ලා මෙම ස්ථාන කේන්ද්‍රගතව සැබෑ ලෙසම සංචාරක කර්මාන්තය දියුණු කිරීමට ඉදිරිපත් කෙරෙන නිගමනය සහ මෙතෙක් ඛණ්ඩණව පැවති විවිධ ආයතන ඒකරාශී කරමින් නව යෝජනා සකසමින් ගාලු පුරවරයේ සංචාරක කර්මාන්තයට නව මංපෙත් විවර කිරීමට සංචාරක පහසුකම් ප්‍රමාණවත් බව හා තවදුරටත් පහසුකම් සැපයික හැකිබවත්, අධ්‍යයනයට යොමු වූ විහාරස්ථාන අතුරින් සංචාරක වැඩි පහසුකම් ඇති විහාරස්ථානය හඳුනා ගැනීමටත් හැකි විය.


| | |
|---|---|
| .සංචාරක | **tourist** |
| සංවර්ධනය | **develop** |
| විහාරස්ථාන | **temple** |
| ආකර්ශනය | **attraction** |
| මාර්ගෝපදේශක | **guide** |